## 418 නිමල කුමරියේ

නිමල කුමරියේ දේව දියණියේ
මරිය රැජිණියේ ඔබට මංගල වේ
පාපි සරණයේ ජේසු මෑණියේ
පව්ටු අප වෙතේ සරණ වෙනු මැනේ

ඒව දරුවූ අපට හිමි වූ ජම්ම කිළුටෙනා
දේව පුතුගෙ වරමින ඔබ මිදුණි නිතියෙනා

අඳුරු ලොවෙහි ඥාණ එළිය දල්වනුය අනේ
ජේසු වෙතට යන මග පහදා දෙනු මව්නේ

දුබල අපගෙ රැකවරණය මරියනි ඔබ වේ
දුගිවූ අපගෙ නිති සරණය මව්නි ඔබම වේ

බිළිඳු ජේසු ඔබ තුරුලෙහි වැඩුණු විලසිනේ
අප දරු කැල රැක ගනු මැන ඔබ සළු සෙවණේ

ඔබ කුමරුගෙ මිදි උයනෙහි නිති සේවයටා
ලක් දරුවන් හට ලැබ දෙනු සුරිඳුගේ පිහිටා

අපගෙ පවුල් සැමටම ඔබ රැජිණිය වේවා
දෙව් රජිඳුට අප සැම හද නිති කැපවේවා